

# කුහුඹු පැටවුන්ගේ ලෝකයේ





ජනිසා මින්දුලී හේරත්
1 ශ්‍රේණිය C
මහාමායා බාලිකා විදුහල
මහනුවර

# කුහුඹු පැන්චන්ගේ ලෝකය

ජනීසා මින්දදුලී හේරත්

කුහුඹු පැන්චන්ගේ ලෝකය

---

© ජනීසා මින්දුලි හේරත්
මහාමායා බාලිකා විදුහල
1 ශ්‍රේණිය D
2025.02.08

# පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියත් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.


අද නම් ලස්සනට ඉර පායලා....... හරිම ලස්සන දවසක්..... වෙනදා වගේම උදෙන්ම නැගිටලා මිදුලට යනකොට බිම තියෙන පුංචි ගුලකින් ඉක්මනට ඉක්මනට උඩට එන කූඹි පොකුරක් මම දැක්කා...

ආනේ.... හරිම කඩිසර පුංචි පැටවු ටිකක්... මම හිමින් හිමින් එයාලට ළං වුණා. මට ආස හිතුණා එයාලා කරන දේවල් බලාගෙන ඉන්න.



මම ඉක්මනට කුස්සියට ගිහින් අම්මාගෙන් සීනි ටිකක් ඉල්ලගෙන කූඹි ගුල ළඟට දාලා එයාලා කරන දේ බලාගෙන හිටියා.

අනේ පවු... මම සීනි දානකොට එයාලා ටිකක් කලබල වුණා. එයාලට බය හිතෙන්න ඇති. ඒත් ටික වේලාවකින් ආයෙමත් සන්සුන් වුණා කූඹි පැංචෝ මම දාපු සීනි ඇට එකින් එක...... එකින් එක පුංචි අත්වලින් අල්ලගෙන එයාලගේ ගුල ඇතුළට අරන් එනවා මම දැක්කා. අපේ අම්මා කියනවා එයාලා ගෙදරට කෑම රැස් කරනවාලු....





අම්මෝ... මේන් මෙතන තවත් වැඩක්.... ටිකක් ලොකු කූඹිච්චියෝ දෙන්නෙක් ලොකුම ලොකු සීනි ඇටයක් දෙපැත්තෙන් අල්ලගෙන කූඹි ගුල ඇතුලට අරන් යනවා.එයාලගේ සමගිය නිසා ලොකුම ලොකු සීනි ඇටත් ගුල ඇතුලට අරන් යන්න පුළුවන් වුණා.

පුංචි අපිත් ඒ වගේම සමගියෙන් වැඩ කළොත් කරන්න බැරි දෙයක් නෑ කියලා මට හිතුනා.



ආයේ දවසක මම කූඹි ගුල ළඟ බලාගෙන හිටියා.එයාලා ගොඩක් දුර ගමනක් යන්න පිටත්වෙලා වගෙයි. හරිම පිළිවෙළකට, පෙළියට එක්කෙනා පස්සේ එක්කෙනා යනවා...

මට අපේ ප්‍රමිතා මැඩම් මතක් වුණා. අපට කියන්නේ පන්තියෙන් එළියට යනකොට ලස්සන පේළියක් හැදිලා යන්න කියලයි.

කූඹි පැංචෝ යන විදිහ දැක්කා .මමත් හිතාගත්තා අපේ මැඩම් අපිට කියලා දෙන විදිහටම ආයේ පන්තියෙන් එළියට යනකොට ලස්සන පේළියකට යන්න ඕනේ කියලා..



මෙන්න හරිම පුදුම වැඩක් ... කූඹි පැංචෝ පේළියට යනකොට ඉස්සරහින් එන තවත් කූඹිච්චෙක් එක්ක මොනවදෝ කතා කරනවා...

මම හොඳට ඒක දිහා බලාගෙන හිටියත් එයාලා කථා කරන්නේ මොනවද කියලා නම් මට තේරුම් ගන්න බැරි වුණා...



හොඳට ඉර පායලා තියෙන දවසට කූඹි පැංචෝ ටික කඩිසර ගමනින් එහෙ මෙහෙ ගියාට වැහි දවසට නම් එයාලා ගුලෙන් එළියට එන්න ටිකක් කම්මැළියි වගේ අපේ අම්මා කියනවා වැස්ස නැති දවස්වලට එයාලා කම්මැළි නැතිව, හරිම කඩිසරකමින් කෑම ගොඩක් කූඹි ගෙදරට එකතු කරගන්නවාලු.

ඊට පස්සේ වැහි දවස්වලට එළියට ආවොත් තෙමෙන නිසා කූඹි ගෙදර ඇතුලටම වෙලා කූඹි අම්මා,කූඹි තාත්තා, කූඹි පැංචලා හැමෝම සතුටින් කාලා බීලා ඉන්නවාලු.



ඒක නම් අපිටත් හොඳ පාඩමක් අපිට වැඩ කරන්න පුළුවන් කාලෙට ඉදිරිය ගැන හිතලා ඉතුරු කරගත්තොත් හැමදාමත් එක වගේ සතුටින් ඉන්න පුළුවන් කියලා අපේ අත්තම්මත් කිව්වා.



ඊයේ රෑ එළිවෙනකල් හොඳටම වැස්සා...හරිම සීතල දවසක්..... උදෙන්ම මම කූඹි ගුල බලන්න ගියා... අනේ එයාලා හරිම කලබලෙන් එහේ මෙහේ දුවනවා... හැමෝම සුදුපාට පුංචි බෝලයක් උස්සාගෙන වේගයෙන් යනවා. මම අම්මාගෙන් ඇහුවා ඒවා මොවාද කියලා...
ඒවා කූඹි බිත්තරලු... අපේ අම්මා කියනවා ඊයේ රෑ වැස්සට පොළවට වතුර උණලා නිසා කූඹි පැංචෝ ටික එයාලගේ බිත්තරත් අරගෙන වෙන ගෙදරක් හොයාගෙන යනවාලු...

අනේ පවු.... මට හරියට දුක හිතුණා... මගේ කූඹි යාළුවන්ට ලොකු කරදරයක් වෙලා...

දවස් කීපයකට පස්සේ මම පින්තූර කපන්න පරණ පත්තර වගයක් ඇද්දා....

මෙන්න බොලේ කූඹි යාළුවෝ ටික එතන... එයාලාගේ බිත්තර ටික පත්තර ගොඩ අස්සේ පරිස්සමට තියලා එයාලත් එතනම පදිංචි වෙලා.

මට පුදුම හිතුණා... කූඹි බිත්තර ටික පරිස්සම් කරගන්න එයාලත් කොච්චර මහන්සි වෙනවද කියලා මට හිතුනා...

අපේ අම්මවයි අප්පච්චිවයි මට මතක් වුණා... එයාලත් අපිව පරිස්සම් කරන්න ගොඩක් මහන්සි වෙනවා...







දවස් කිහිපයක්ම මම කූඹි පැංචන්ගේ ලෝකය දිහා බලාගෙන හිටියා. පුංචි වුණාත් එයාලගෙන් ඉගෙන ගන්න ගොඩක් දේවල් තියෙනවා කියලා මට හිතුණා...

කඩිසරකම, පිළිවෙල, ආරක්ෂාව, සමඟිය වගේ ගොඩක් හොඳ ගති ගුණ පුංචි අපිත් කූඹි පැන්චන්ගෙන් ඉගෙන ගනිමු...









## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්